(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 11(1).]

# පාර්ලිමේන්තුවේ අංක 11 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2014 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා

## 2014 මැයි මස 22 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2224/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, කුරුණෑගල, අනුරාධපුර, මහනුවර යන දිස්ත්‍රික්කවල විදේශ රැකියාවල යෙදෙන්නන් වෙනුවෙන්ම නිවාස 15000කින් සමන්විත නව නිවාස යෝජනා ක්‍රම තුනක් ආරම්භ කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස ව්‍යාපෘති ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වන විට ඉදිකිරීම් අවසන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති නගර කවරේද;

(iv) ඉදිකිරීම් අවසන් ව්‍යාපෘතිවල පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3223/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 ජනවාරි මස 01 වැනිදා සිට මේ දක්වා විශ්‍රාම වැටුප් හිමි රජයේ සේවකයන් හට වැටුප් වැඩිවීම් ලැබුණු දිනයන් සහ එක් එක් අවස්ථාවේදී වැඩි කරන ලද මුදල් ප්‍රමාණයන් කවරේද;

(ii) වැටුප් වර්ධකය හිමි දැනට සේවය කරන සමස්ත රජයේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2005 ජනවාරි මස 01 වැනිදා සිට මේ දක්වා එක් එක් වර්ෂය තුළ වැඩි කරන ලද දීමනා කවරේද;

(iv) දීමනා වැඩි කිරීම මගින් ඇති වූ සමස්ත බලපෑම සහ එකී බලපෑම ඇති වූ රජයේ සේවකයන් සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3332/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2008 - 2012 කාල පරිච්ඡේදයේදී ළමා අපයෝජන සම්බන්ධයෙන් පොලිස් කාන්තා හා ළමා කාර්යාංශය වෙත ලැබූ පැමිණිලි සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2012 වර්ෂයේ පොලිස් වාර්තා අනුව දිනකට සිදුවූ ළමා අපයෝජනයන්හි සාමාන්‍ය අගය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2008 - 2012 කාල සීමාව තුළදී,

(i) ළමා අපයෝජන සම්බන්ධයෙන් දේශපාලනයට සම්බන්ධ පුද්ගලයින් චූදිතයන් ලෙස නම් කෙරුණු අවස්ථා තිබේද;

(ii) එසේ නම්, එවැනි අවස්ථා ගණන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3592/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හක්මන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩකර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩකිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා හක්මන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩකිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩකිරීමට අවසර ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3708/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා සඳහා අනුමත කොට ඇති සම්බන්ධීකරණ ලේකම්වරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) වත්මන් ජනාධිපතිවරයා යටතේ පත්කර ඇති සම්බන්ධීකරණ ලේකම්වරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සම්බන්ධීකරණ ලේකම්වරුන් පත්කර ඇති ක්ෂේත්‍ර කවරේද;

(iv) එම එක් එක් ලේකම්වරයාගේ නම, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එක් සම්බන්ධීකරණ ලේකම්වරයෙකු වෙනුවෙන් ගෙවනු ලබන වැටුප, අනෙකුත් දීමනා සහ ලබා දෙන පහසුකම් කවරේද;

(vi) ඒ අනුව සම්බන්ධීකරණ ලේකම්වරුන් වෙනුවෙන් පසුගිය වර්ෂ 3 තුළ දරා ඇති සමස්ත පිරිවැය කොපමණද;

(vii) එම පිරිවැයට සාපේක්ෂව ප්‍රමාණවත් කාර්යභාරයක් එම ලේකම්වරුන් විසින් ඉටුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3913/'13

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු මැද පළාතේ,

(i) වර්ෂ 2005-2012 කාල සීමාව තුළ මියගිය සමස්ත පිළිකා රෝගීන් සංඛ්‍යාව;

(ii) එක් එක් රෝහලේදී මිය ගිය එම රෝගීන් සංඛ්‍යාව;

(iii) රජයේ රෝහල් වලින් දැනට ප්‍රතිකාර ලබන සමස්ත පිළිකා රෝගීන් සංඛ්‍යාව;

(iv) එක් එක් රජයේ රෝහල්වල ප්‍රතිකාර ගනු ලබන එම රෝගීන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු මැද පළාතේ පිළිකා රෝගීන් සඳහා ප්‍රමාණවත් තරම් ඖෂධ තිබේද ;

(ii) එම පළාතේ පිළිකා රෝගීන් සීඝ්‍රයෙන් වැඩිවී ඇති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එයට හේතු කවරේද ;

(iv) එම හේතු වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4109/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් e - NIC ව්‍යාපෘතිය වෙනුවෙන් ලංකා ලොජිස්ටික් සමාගමට එක් එක් අවස්ථාවේදී ගෙවා ඇති මුදල් ප්‍රමාණයන් කොපමණද;

(ii) එම ගෙවීම් සිදුකරන ලද දිනයන් කවරේද;

(iii) ඉහත කී ව්‍යාපෘතිය වෙනුවෙන් 2012.12.31 දින ලංකා ලොජිස්ටික් සමාගම විසින් රු. 37,649,044.00ක මුදලක් ඉල්ලා තිබේද;

(iv) එකී මුදල් ප්‍රමාණය ඉහත සමාගම වෙත ගෙවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලංකා ලොජිස්ටික් සමාගම විසින් e - NIC ව්‍යාපෘතියට අදාළව ලබාදී ඇති සේවාවන් සහ එම එක් එක් සේවාවට අදාළ වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) e - NIC ව්‍යාපෘතියේ සියලු කටයුතු සඳහා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට නියමිතව තිබියදී, අතරමැදි ආයතනයකට විශාල මුදලක් ගෙවීමට හේතුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4312/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව පෞද්ගලීකරණය කළ වර්ෂය කවරේද;

(ii) පෞද්ගලීකරණය කරන විට රාජ්‍ය ඉස්කාගාර සංස්ථාවේ සේවය කරන ලද සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව ආරම්භ කිරීමේදී එවකට සිටි මුදල් අමාත්‍ය ගරු ආචාර්ය ඇන්. එම්. පෙරේරා මහතා විසින් රාජ්‍ය ඉස්කාගාර සංස්ථාවේ සේවකයින් වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ තැන්පත් කරන ලද මුදල කොපමණද;

(iv) රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව පෞද්ගලීකරණය කිරීමෙන් පසු නව සමාගමේ සේවය කිරීමට අකමැති වූ සේවකයින් අතරින් ඉල්ලා අස් වූ, අස් කරන ලද හා සේවය අතහැර ගිය සේවකයින්ට කිසියම් වන්දි මුදලක් මහා භාණ්ඩාගාරයේ තැන්පත් කරන ලද මුදලින් ලබාදීමට කටයුතු කළේද;

(v) එසේ නම්, එම එක් එක් සේවකයින් වෙනුවෙන් ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4321/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ හෙද සේවයේ මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) හෙද සේවයේ පවතින එම පුරප්පාඩු ගණනය කිරීම සඳහා යොදා ගත් පදනම (රෝගීන්, රෝහල් ඇඳන් සංඛ්‍යාව හෝ වෙනත් ආදී වශයෙන්) කවරේද;

(iii) හෙද සේවය සඳහා තෝරා ගන්නා ලද පිරිසට ස්ථිර පත්වීම් දීමට පෙර කොපමණ කාල සීමාවක පුහුණුවක් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයිනේ ඇති හෙද අභ්‍යාස විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම හෙද අභ්‍යාස විද්‍යාලයන්හි වර්ෂයක් තුළදී පුහුණුව ලබා දිය හැකි හෙද හෙදියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම අභ්‍යාස විද්‍යාලයන්හි අධ්‍යයන කාර්යය මණ්ඩලය (දේශකවරුන්) සඳහා පුරප්පාඩු පවතින්නේද;

(iv) එසේ නම්, එම පුරප්පාඩු පිරවීම පිළිබඳව අවධානය යොමු වී තිබේද;

(v) එම පුරප්පාඩු පිරවීම සිදුකරනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4410/'13

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2014 වර්ෂයේ දැයට කිරුළ වැඩ සටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සංවර්ධනය කරනු ලබන මාර්ග කවරේද;

(ii) එම මාර්ගයන්හි සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම් සිදුකර තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් මාර්ගයේ සංවර්ධනයට අදාළව ටෙන්ඩර් ප්‍රදානය කරන ලද ආයතන කවරේද;

(iv) එක් එක් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ප්‍රදානය කරන ලද ටෙන්ඩර්වලට අදාළ ගිවිසුම් ගත මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4445/'13

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාව මත ශ්‍රී ලංකා විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරි තනතුරට උසස් කිරීම සඳහා 2013 වර්ෂයේ ජනවාරි මස පැවති තරග විභාගයට අදාළ කර ගත් විෂයයන් සංඛ්‍යාව, පෙනී සිටි සංඛ්‍යාව සහ ඉන් සමත් වූ සංඛ්‍යාව;

(ii) එම තනතුරට බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව සහ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ සංඛ්‍යාව;

(iii) එම පිරිස සම්මුඛ පරීක්ෂණයේදී සහ ලිඛිත විභාගයේදී ලබා ගත් ලකුණු සංඛ්‍යාව;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම සම්මුඛ පරීක්ෂණයේදී,

(i) ලකුණු ලබා දුන් නිර්ණායකයන් කවරේද;

(ii) ජ්‍යෙෂ්ඨත්වයට හා කුසලතාවයන්ට ලකුණු ලබා දුන් පදනම කවරේද;

(iii) පළපුරුද්ද සඳහා ලකුණු ලබා දීමේදී සළකා බැලූ කාර්යභාර නිලධාරී (Group Officer) තනතුර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබේද;

(iv) එම තනතුරට ලකුණු ලබා දීමට පදනම් කර ගත් නීති රීති සහ චක්‍රලේඛ කවරේද;

(v) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලකුණු 05ක් හෝ ලබා දීමේ අවස්ථාව අහිමි කිරීමට; සහ

(vi) රාජකාරියට අදාළ වන ලෙස උපයා ගෙන ඇති වෙනත් ඉහළ අධ්‍යාපන සුදුසුකම්වලට ලකුණු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4557/'13

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමානයේ සමෘද්ධි සහනාධාරය ලබන සමස්ත පිරිස කොපමණද;

(ii) එම ප්‍රතිලාභය සැබෑ දුප්පතුන්ට නොලැබී යන බවට කෙරෙන චෝදනාව පිළිගන්නේද;

(iii) සමෘද්ධිලාභියෙකුට දැනට මාසිකව ලැබෙන මුදල දරිද්‍රතා මට්ටමෙන් මිදීමට ප්‍රමාණවත් නොවන බවට පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4628/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට ජීවන වියම් දීමනාව ගණනය කෙරෙන ආකාරය කවරේද;

(ii) ජීවන වියදම් දීමනාවේ ඒකක අගය (ඒකකයකට රුපියල්වලින්) ගණනය කෙරෙන ආකාරය කවරේද;

(iii) ඉහත සඳහන් අගය (ඒකක අගය) අවසන් වරට ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද්දේ කවදාද;

(iv) ඉහත කී ඒකක පිරිවැය අවසන් වරට ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමේ සිට එය සංශෝධනය කිරීමට හේතු ඇති වී තිබේද;

(v) එසේ නම්, ජීවන වියදම් දීමනාවේ නව ඒකක අගය හඳුන්වා දෙමින් ගැසට් පත්‍රයක් ප්‍රකාශයට පත් කිරීමට උපදෙස් දෙනු ලබන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4739/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති සමස්ත පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් විදුලිය ලබා දී ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) රජය මගින් විදුලි බිල් ගෙවනු ලබන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) සියලුම පාසල්වල විදුලි බිල් රජය මගින් ගෙවීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2506/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටා තිබෙන කිරිඉබ්බන්වැව විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත්වල ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කිරිඉබ්බන්වැව විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද;

(ii) එම අඩුපාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 මැයි මස 23 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2368/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාව මගින් පාසල් දරුවන්ට දිවා ආහාරය සඳහා බත් වේලක් නොමිලේ ලබා දෙන බවට පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි සෑම පාසල් දරුවෙකුටම දිවා ආහාරය හිමි වන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) මේ වන විට දිවා ආහාරය සඳහා බත් වේලක් ලබා දෙන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) දිවා ආහාර ලබා දීම සඳහා එම පාසල් තෝරා ගත් පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3231/'12

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකුට දරන වියදම සහ සේවකයකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3593/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩකර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩකිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම්, ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩකිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩකිරීමට අවසර ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3626/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන්ඇසීමට,— (1)

(අ) කොළඹ සුගතදාස ක්‍රීඩා පිටියේ අලුතින් අතුරන ලද "සැන්විච්" ධාවන පථය අලුත්වැඩියා කිරීමේ තත්ත්වයක් ඇතිවී තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත කරුණ සොයා බැලීමට ක්‍රීඩා අමාත්‍යාංශය විසින් කමිටුවක් පත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයන් කවුරුන්ද;

(iii) එම කමිටුව පත් කළ දිනය කවරේද;

(iv) එම කමිටුවේ නිර්දේශයන් කවරේද;

(v) ඉහත සඳහන් නව ධාවන පථයේ ඉදිකිරීම් කටයුතු භාරදුන් සමාගම හෝ පුද්ගලයින් කවරේද;

(vi) එහි ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් සොයා බැලීමට ජනාධිපති විමර්ශණ ඒකකයෙන්ද කමිටුවක් පත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3709/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා සඳහා අනුමත කොට ඇති උපදේශකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) වත්මන් ජනාධිපතිවරයා යටතේ උපදේශකවරුන් පත්කර ඇති ක්ෂේත්‍ර කවරේද;

(iii) එම උපදේශකවරුන් වෙනුවෙන් පසුගිය වර්ෂ 3 තුළ දැරූ පිරිවැය කවරේද;

(iv) එම පිරිවැයට සාපේක්ෂව එම උපදේශකවරුන් ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3823/'13

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි වකුගඩු රෝගීන්ගේ ලේ පිරිසිදු කිරීම් කටයුතු සිදු කරන රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල් කවරේද;

(iii) එම එක් එක් රෝහලේ ඇති ලේ පිරිසිදු කිරීමේ යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් රෝහලේ එක් දිනක් තුළ ලේ පිරිසිදු කිරීම් සඳහා භාජනය වන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(v) වකුගඩු රෝගීන්ගේ රුධිරය පිරිසිදු කිරීමේ කාර්යයන් සඳහා අනුයුක්ත කර ඇති වෛද්‍යවරුන් සහ හෙද කාර්ය මණ්ඩලය එම එක් එක් රෝහල අනුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති සෞඛ්‍ය සේවා කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාර්යාල හරහා මේ වන විට හඳුනාගෙන ඇති වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුර මහ රෝහලේ වකුගඩු බද්ධ කිරීම් කටයුතු සිදු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම කටයුතු ආරම්භ කළ දිනය කවරේද;

(iii) වකුගඩු බද්ධ කිරීමක් දැනට සිදු නොකරන්නේ නම්, එයට ඇති අපහසුතා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4290/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ දකුණු වරායේ නව පර්යන්තය හෙවත් අභිමන්තොට පර්යන්තය ඉදිකිරීම සඳහා කොපමණ මුදලක් වැය වී තිබේද;

(ii) ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා ගත් මූලාශ්‍ර කවරේද;

(iii) මෙම පර්යන්තය ඉදිකිරීම සඳහා චීන සමාගම සමග එකඟත්වයක් ඇති කර ගත් දිනය කවරේද;

(iv) එහිදී එකඟ වූ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම නව පර්යන්තය 2048 වන තුරු චයිනා මර්චන්ට් හෝල්ඩින් හොංකොං සමාගම වෙත වසර 35කට බදු දී ඇති බවට පළ වී ඇති වාර්තාවල සත්‍යතාවයක් තිබේද;

(ii) එසේ නම්, බදු දීමේ කොන්දේසි, ආදායම් බෙදී යන ආකාරය, මෙහෙයුම් හා වගකීම් සිදුකරන ආකාරය කවරේද;

(iii) ජාතික ආර්ථික මර්මස්ථානයක් වූ වරාය මෙසේ කොටස් වශයෙන් බදු දීම මගින් වරායේ මෙහෙයුම් පුද්ගලික අංශයට පැවරීම සිදුවන බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4332/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට ක්‍රියාත්මක වන අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව එක් එක් විෂයය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2013 වර්ෂයේදී එක් එක් විද්‍යාපීඨයේ අධ්‍යාපනය ලැබූ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන විද්‍යාපීඨවල සේවය කරන පීඨාධිපතිවරුන්ගේ නම් හා සුදුසුකම් කවරේද;

(ii) විද්‍යාපීඨ පීඨාධිපති තනතුර දැරීම සඳහා තිබිය යුතු අවම සුදුසුකම් කවරේද;

(iii) එම විද්‍යාපීඨවල කථිකාචාර්යවරුන්ගේ හිඟයක් පවතින්නේද;

(iv) එසේ නම්, කථිකාචාර්ය හිඟය පවතින විද්‍යාපීඨ සහ විෂයයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4438/'13

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍ය උපාධි (MBBS) පාඨමාලාව හැදෑරීම සඳහා මාලඹේ පිහිටි SAITM පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට ප්‍රථම වරට සිසුන් ඇතුළත් කරගනු ලැබූ වර්ෂය කවරේද;

(ii) 2013 සැප්තැම්බර් මස 30 වැනි දින වන විට ඉහත උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටි දේශීය සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2013 වර්ෂයේ ලියාපදිංචි වූ සිසුවෙකු එම පාඨමාලාව සඳහා ගෙවිය යුතු සම්පූර්ණ ගාස්තුව කොපමණද;

(iv) මෙම ආයතනය පිහිටුවීමේදී දේශීය සිසුන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ ක්‍රමවේදයක් සඳහා එකඟතාවයක් ඇතිවී තිබේද;

(v) එසේ නම්, එකී එකඟතාවය කවරේද;

(vi) ඒ අනුව මේ වන විට ලියාපදිංචි වී ඇති සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් පූර්ණ ශිෂ්‍යත්ව ප්‍රදානය කර ඇති සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4528/'13

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විගණකාධිපති දෙපාර්තමේන්තුව තුළ සේවය කරන කාර්යභාර නිලධාරී (Group Officer) තනතුරට නිලධාරීන් පත් කර ගන්නා ආකාරය දැනට ක්‍රියාත්මක වන විගණන පරීක්ෂක සේවා ව්‍යවස්ථාවේ සඳහන්ව තිබේද;

(ii) ජ්‍යෙෂ්ඨත්වය, සම්මුඛ පරීක්ෂණය, තරග විභාග හෝ අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් අනුව එම පත් කිරීම් සිදු කර තිබේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4665/'13

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මගින් රාජ්‍යතාන්ත්‍රික ගුවන් ගමන් බලපත්‍ර නිකුත් කරනු ලබන තනතුරු කවරේද;

(ii) 2005 වර්ෂයේ සිට 2013 වර්ෂයේ දෙසැම්බර් මස 31 දින දක්වා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර ලබා දී ඇති අයගේ නම් සහ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4745/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ කෘෂි රසායනික අංශයක් තිබේද;

(ii) එහි නිෂ්පාදනය කරන කෘෂි රසායන ද්‍රව්‍ය බෙදා හැරීමේ ක්‍රමවේදය කවරේද;

(iii) එම අංශය සඳහා ගබඩා පහසුකම් තිබේද;

(iv) එම ගබඩාවල කල් ඉකුත් වූ කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩා කර ඇති බව දන්නේද;

(v) එම කල් ඉකුත් වූ කෘෂි රසායන ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2505/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටා තිබෙන සම්පත්නුවර විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත්වල ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සම්පත්නුවර විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද;

(ii) එම අඩු පාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3233/'12

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාර්ග සංවර්ධන අධිකාරියට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට පවතින ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3737/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012 වර්ෂයේ ඒකාබද්ධ තැපැල් සේවයේ "ආ" කාණ්ඩයේ I "ආ" ශ්‍රේණියේ තැපැල් නිලධාරී තනතුරට නිලධාරීන් බඳවා ගැනීම සඳහා තරඟ විභාගයක් පැවැත්වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් කවරේද;

(ii) එම බඳවා ගැනීම සඳහා පැවති තරඟ විභාගය සමත්වූ සංඛ්‍යාව කොපමණද;

(iii) සමත් පිරිසෙන් මේ වන විට බඳවාගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) එම පිරිස බඳවා ගැනීමට අදාළ කරගත් අවම ලකුණු ප්‍රමාණය කොපමණද;

(v) සුදුස්සන් තෝරා ගැනීම සඳහා තරඟ විභාගයේ ලකුණුවලට අමතරව ඔවුන්ගේ පරිගණක සාක්ෂරතාවද සනාථ කරගැනීම සඳහා සලකා බැලූ පිළිගත හැකි සහතික නිකුත් කළ ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) තැපැල් නිලධාරීන් බඳවා ගැනීමේදී වැඩි ලකුණු ලබාගත් අයට පත්වීම් ලබා නොදී, අඩු ලකුණු ලබාගත් අයට හිතවත්කම් මත පත්වීම් ලබා දී ඇති බවට එම විභාග අපේක්ෂකයින් චෝදනා කරන බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා ආසාධාරණයට ලක්වූ අයට පත්වීම් ලබාදීම සඳහා කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ජූනි මස 03 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2439/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, නිල්වලා නිම්නය දෙපස පිහිටා ඇති කිරල කැලේ ප්‍රදේශයේ කුඹුරු විශාල ප්‍රමාණයක් පුරන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩම් වී හෝ වෙනත් බෝග වර්ග වගා කිරීම සඳහා සුදුසු පරිදි සකස් කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම කවරේද;

(iii) මේ වන විට එම බිම් අස්වැද්දීමට අදාළ කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2469/'12

ගරු රවී කරුණානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මේ දක්වා පවත්වා ඇති "දැයට කිරුළ" ප්‍රදර්ශන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ප්‍රදර්ශනය පැවැත්වූ ස්ථානය කවරේද;

(iii) එම එක් එක් ප්‍රදර්ශනය සඳහා වැය කළ මුදල කවරේද;

(iv) අනාගතයේදී පැවැත්වීමට සැලසුම් කර ඇති දැයට කිරුළ ප්‍රදර්ශන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවති "දැයට කිරුළ" ප්‍රදර්ශනය පැවැත්වූ දිනය කවරේද;

(ii) එය පැවැත්වූ ස්ථානය සහ එකී ප්‍රදර්ශන භූමිය සඳහා පවරාගත් ඉඩම් ප්‍රමාණය කවරේද;

(iii) එම ප්‍රදර්ශනය සඳහා වූ සමස්ත පිරිවැය සහ එක් එක් අමාත්‍යාංශය වෙනුවෙන් වැයකළ මුදල කොපමණද;

(iv) ඒ සඳහා ගනු ලැබූ ප්‍රාග්ධන භාණ්ඩ සඳහා වැය කළ මුදල සමස්ත වියදමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(v) එම භූමියේ දැනට ඉතිරිව ඇති ප්‍රාග්ධන භාණ්ඩ හෝ ගොඩනැගිලි කවරේද;

(vi) එම ප්‍රදර්ශනය සඳහා ගනු ලැබූ ඉහත සඳහන් ප්‍රාග්ධන භාණ්ඩ සඳහා වැය කළ වියදම සාධාරණීකරණය කළ හැකිවන්නේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2504/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටා තිබෙන ජනකපුර විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත්වල ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ජනකපුර විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද;

(ii) එම අඩුපාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3264/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කොරියානු භාෂා ප්‍රවීණතා විභාගයට පෙනී සිටීම සඳහා 2012 අගෝස්තු මස 20 වැනි දින සිට ප්‍රවේශපත් නිකුත් කළ මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානවලින් නිකුත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 වර්ෂයේදී කොරියානු භාෂා ප්‍රවීණතා විභාගය වෙනුවෙන් නිකුත් කළ අයදුම්පත් සංඛ්‍යාව, එයට පෙනී සිටි සංඛ්‍යාව, සමත් වූ සංඛ්‍යාව සහ එම විභාග ප්‍රතිඵල මත කොරියානු රජයේ විදේශ රැකියා අවස්ථාවන් ලැබූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2011 වර්ෂයේ කොරියානු භාෂා ප්‍රවීණතා විභාගයේ අයදුම්පත් ලබා ගැනීමට විදේශ ගමන් බලපත්‍රය අනිවාර්ය කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3367/’12

ගරු පී. හැරිසන් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජයේ ලියාපදිංචි, ආරක්ෂක රැකවරණ ලබන ළමා නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සිටින ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් ළමයෙකුගේ නඩත්තු කටයුතු වෙනුවෙන් 2013 වර්ෂය සඳහා වෙන් කර තිබූ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ ඇති ළමා රැඳවුම් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සිටින ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් ළමයෙකු වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම මුදල ඔවුන්ගේ නඩත්තු කටයුතු සඳහා ප්‍රමාණවත් වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ ) නොඑසේ නම්, ඒ මන්ද?

3699/’13

ගරු අනුර දිසානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2013 පෙබරවාරි මාසය තුළ පෙට්‍රල් මෙට්‍රික් ටොන් එකක් ආනයනය කරන ලද සාමාන්‍ය මිල (CIF VALUE);

(ii) මෙට්‍රික් ටොන් එකක ආසන්න වශයෙන් අඩංගු පෙට්‍රල් ලීටර් සංඛ්‍යාව;

(iii) ඒ අනුව 2013 පෙබරවාරි මාසය තුළ පෙට්‍රල් ලීටරයක් වරායෙන් ගොඩබාන විට තිබූ සාමාන්‍ය මිල;

(iv) පෙට්‍රල් ලීටරයක් වෙනුවෙන් රජය විසින් අය කරනු ලබන එක් එක් බදු ප්‍රමාණයන්;

(v) පෙට්‍රල් ලීටරයකින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබන ලාභය;

(vi) පෙට්‍රල් ලීටරයක් බෙදා හැරීමේ වියදම හා අලෙවි කිරීම මගින් පිරවුම් හල ලබන ලාභය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4074/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 හා 2013 වර්ෂවල අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවලදී සිදු වී ඇති අනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම අනතුරු හේතු කොට ගෙන ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එවැනි අනතුරු සිදුවීම අවම කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට හඳුනාගෙන ඇති අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග පවතින ස්ථාන කවරේද;

(ii) ඒ ඒ ස්ථානවල අනතුරු අවම කිරීම සඳහා යෙදීමට බලාපොරොත්තු වන ආරක්ෂක වැඩපිළිවෙළ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම ආරක්ෂක වැඩපිළිවෙළ සඳහා වැය වන මුදල ඇස්තමේන්තු කර තිබේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ දෙක තුළ සවිකර ඇති නව දුම්රිය ආරක්ෂිත ගේට්ටු සහ ආරක්ෂිත විදුලි සංඥා පද්ධති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා සවි කළ ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා දරන ලද වියදම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4219/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සිවිල් මුල් අවස්ථා අධිකරණයන්හි ප්‍රමාදය අවම කිරීම පිණිස 2010, 2011, 2012 සහ 2013 යන එක් එක් වර්ෂයේදී අධිකරණ අමාත්‍යාංශය විසින් ගන්නා ලද පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සිවිල් මුල් අවස්ථා අධිකරණයන්හි නඩු කටයුතු සැලකිය යුතු වේගයකින් සිදුවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4340/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ, පැරණි සිලාවතුර තැපැල් කාර්යාලයෙහි බොහෝ අඩුපාඩු පවතින බවත්;

(ii) එම තැපැල් කාර්යාලය වැඩි දියුණු කළහොත් වර්තමානයේ එම ප්‍රදේශයේ පදිංචිව සිටින ජනතාවට ප්‍රයෝජනවත් වන බවත්;

(iii) දැනට එම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට තැපැල් සේවාවන් ලබා ගැනීම සඳහා කිලෝමීටර් 17ක දුරින් පිහිටි මුරුංගන් තැපැල් කාර්යාලයට යාමට සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සිලාවතුර තැපැල් කාර්යාලයේ පවතින අඩුපාඩු සපුරාලීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4341/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් ලංකා බැංකුවේ, නිදහස් චතුරශ්‍ර ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 2323310 ට අමතරව එකී බැංකුවේම අංක 2323246 යටතේද ගිණුමක් පවත්වාගෙන ගිය බවත්;

(ii) 2005.04.15 වැනි දින එම ආයතනයේ අංක 4530801719 දරන සාමාන්‍ය බැංකු ගිණුමට එවන ලද රු.4,293,253.00ක මුදල 2005.05.03 වැනි දින අංක 004530207663 දරන වෙනත් ගිණුමකට මාරු කිරීමට එම ආයතනයේ මුදල් කළමනාකරු හා විධායක අධ්‍යක්ෂවරයා නියෝග කළ බවත්;

(iii) එම අතිරේක ගිණුම පිළිබඳ තොරතුරු ඉහත ආයතනය සතුව නොතිබූ බැවින් එම මුදල් කුමන කාර්යයක් සඳහා භාවිතා කළේද යන්න විගණනයේදී හෙළිදරව්වී නොමැති බවත්;

(iv) ඉහත (i)හි සඳහන් අංක 2323246 දරන ගිණුම පිළිබඳව ද කිසිම තොරතුරක් එම ආයතනය සතුව නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගිණුම් අංක 2323310ට අමතරව අංක 2323246 යටතේ තවත් ගිණුමක් පවත්වාගෙන යෑමට හේතුව කවරේද;

(ii) ඉහත අ(i) සහ අ(ii)හි සඳහන් ගිණුම් අංක ඔස්සේ අයථා මුදල් ගණුදෙනු සිදු කළ දූෂිත නිලධාරීන් කවුරුන්ද:

(iii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4407/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ඇඟළුම් නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන කර්මාන්තකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඇඟළුම් කර්මාන්තශාලාවල සේවය කරනු ලබන සේවක සේවිකාවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ඇඟළුම් කර්මාන්තශාලාවල මේ වන විට 30,000ක පමණ සේවක සේවිකා පුරප්පාඩු සංඛ්‍යාවක් පවතින බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඇඟළුම් කර්මාන්තශාලාවල පවතින පුරප්පාඩු මේ දක්වා පුරවනු ලැබුවේ දේශීය ශ්‍රමිකයන් යොදවාගෙන බව පිළිගන්නේද;

(ii) ඉදිරියේදී එම පුරප්පාඩු පිරවීම සඳහා බංගලාදේශය, ඉන්දියාව, මියන්මාරය වැනි රටවලින් විදේශ ශ්‍රමය ගෙන්වා ගැනීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් පවතින්නේද;

(iii) එසේ නම්, එවැනි තත්ත්වයක් ඇතිවීමට බලපෑ හේතු සාධක කවරේද;

(iv) ඒ ආකාරයෙන් ඇඟළුම් ක්ෂේත්‍රයේ පුරප්පාඩු පිරවීම සඳහා විදේශ ශ්‍රමිකයන් යොදවා ගැනීම තුළින් මෙරට තරුණ තරුණියන්ට තිබූ රැකියා අවස්ථා අහිමිවීමක් සිදුවන බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4629/'13

ගරු තලතා අතුකෝරල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්නපුර නව නගර සීමාව තුළ බලංගොඩ වැව්ලි සමාගම යටතේ පවතින ඉඩම් යම් ප්‍රමාණයක්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් අඩු ආදායම්ලාභීන්ට සහ රාජ්‍ය සේවකයින්ට බෙදා දීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට වෙන් කර දී තිබේද;

(ii) එසේ නම්, එම මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) බෙදා දීමට නියමිත ඉඩම් කැබලි සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ බෙදා වෙන් කිරීමට යෝජිත ඉඩම් පර්චසයක තක්සේරු වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ඉඩම් කොටස් බෙදා දීමට යෝජිත එක් එක් රාජ්‍ය සේවකයාගේ නම, ඔහු හෝ ඇය අවසාන වරට දරන ලද තනතුර සහ ලැබීමට නියමිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත ඉඩම්ලාභීන් අතර සිටින එක් එක් අඩු ආදායම්ලාභියාගේ නම, මාසික ආදායම සහ ලැබීමට නියමිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) යෝජිත ඉඩම්ලාභීන් විසින් මුදල් ගෙවීම් කර ඇත්නම්, එම මුදල් ගෙවූ ගිණුම සහ එම ගිණුමේ අංකය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2507/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටා තිබෙන ඇතාවැටුනවැව විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත් ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඇතාවැටුනවැව විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද

(ii) එම අඩුපාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2684/'12

ගරු රවී කරුණානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) "දැයට කිරුළ" ප්‍රදර්ශනයෙහි සංකල්පය එතුමා පැහැදිලි කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා පැවැත්වූ එක් එක් දැයට කිරුළ ප්‍රදර්ශනයෙන් ජනනය කරන ලද රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම රැකියාවන් කවරේද;

(iii) ඒවා ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත රැකියාද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුරයෙහි පැවති දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සත්‍ය වශයෙන්ම මුදල් වැය කළ වැය ශීර්ෂය කවරේද;

(ii) අවසන් වරට පැවැත්වූ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා කිසිදු ගෙවීමකින් තොරව ලබා ගත් ඇතැම් වත්කම් සහ ශ්‍රමය, එනම් සන්නද්ධ හමුදාවන්හි පුද්ගලයන් හෝ ශ්‍රමය සහ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයෙහි බස්රථ වැනි දෑ සම්පූර්ණ පිරිවැය ගණනය කිරීමේදී පිරිවැය සංරචකයන්හි ඇතුළත් කොට තිබේද;

(iii) එසේ නොමැති නම්, ඉහත කී ප්‍රදර්ශනය සඳහා මුළු පිරිවැය ගණනය කළ ආකාරය කවරේද;

(iv) පැවැත්වීමට නියමිත මීළඟ දැයට කිරුළ ප්‍රදර්ශන තුන සඳහා අපේක්ෂිත පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3013/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) හ/තංගල්ල පිරිමි ජාතික පාසලේ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු 2007 අප්‍රේල් මස 4 වැනි දින තංගල්ල බස් නැවතුම්පොළේ සිට ඔහුගේ නිවසට රැගෙන යන අතරමගදී තංගල්ල එවකට හිටපු නගරාධිපතිවරයා විසින් බලවත් ලෙස අපයෝජනයට ලක්කර ඇති බවත්;

(ii) ඒ පිළිබඳව තංගල්ල පිරිමි ජාතික පාසලේ ශිෂ්‍ය උපදේශක ගුරු මහතාට දැන්වීමෙන් පසු තංගල්ල පොලිසියට පැමිණිලි කර ඇති බවත්;

(iii) එම පැමිණිල්ල ඉහත පොලිස් ස්ථානයේ පැමිණිලි අංක C.W.I.B 127 පිටුව 24 වැනි ඡේදයෙහි සටහන් කර ඇති බවත්;

(iv) එම පැමිණිල්ල අනුව එම නගරාධිපතිවරයාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන මෙන් තංගල්ල නගරයේ විශ්‍රාමික පුරවැසි සංගමය ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත පැමිණිල්ල පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ජූනි මස 04 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2562/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ විවිධ පළාත් පාලන ආයතනවල කටයුතු කරන මහජන නියෝජිතයන්හට ලැබෙන මාසික වේතනයන් කොපමණද;

(ii) එම නියෝජිතයින්ට ප්‍රමාණවත් වේතනයන් ලැබෙන්නේද;

(iii) පළාත් පාලන ආයතනවල කටයුතු කරන මහජන නියෝජිතයින්ට ජනතා සේවාවන් ඉටුකිරීම සඳහා ලබා දෙන පහසුකම් හා දීමනා කවරේද;

(iv) ප්‍රශස්ත ජනතා සේවාවක් ඉටුකිරීමට එම දීමනා හා පහසුකම් ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2787/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) සරත් ෆොන්සේකා මහතා නිදහස් කරන ලද දිනය කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සමාව දීම කොන්දේසි සහිත සමාව දීමක්ද; නැතහොත් කොන්දේසි විරහිත සමාව දීමක්ද යන්නත්;

(ii) ෆොන්සේකා මහතාගේ විශ්‍රාමික අයිතිවාසිකම් සහ හමුදා නිල නැවත ලබා දෙන ලද්දේද යන්නත්;

(iii) තවමත් එතුමාව "ජෙනරාල්" යන පදවි නාමයෙන් හැඳින්විය හැකිද යන්නත්;

(iv) ෆොන්සේකා මහතාට එරෙහිව උසාවියේ තවත් පොරොත්තු නඩු තිබේද යන්නත්;

(v) ජනාධිපති සමාව නිසා විභාගවීමට නියමිත එම නඩු අහෝසි වන්නේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සරත් ෆොන්සේකා මහතා සමග කටයුතු කිරීම හෝ එතුමාට සහාය දීම නිසා පීඩාවට හෙළන ලද හෝ සේවය අවසන් කිරීමට ලක්වූ පොලිසියේ හෝ හමුදාවේ හටයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම හෝ වන්දි ලබා දීම සිදුකර තිබේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) සරත් ෆොන්සේකා මහතා නිදහස් කිරීමේ කරුණට අදාළව,

(i) ඒ පිළිබඳව සාකච්ඡා පැවැත්වූ පුද්ගලයින් කවුරුන්ද යන්නත්;

(ii) ඒ සම්බන්ධයෙන් බලපෑම් ඇති කළ රටවල් සහ එය සිදු වූයේ කවර අවස්ථාවක ද යන්නත්;

(iii) දේශපාලන සහ ආගමික නායකයින්ගේ මැදිහත්වීම් නොසලකා හැරියේ මන්ද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

3083/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2002 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල සීමාව තුළ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයේ ඉහළ යෑමට සමානුපාතිකව මිල ඉහළ ගොස් ඇති දුම්වැටි (සිගරට්) වර්ගවල නම් කවරේද;

(ii) එලෙස මිල ඉහළ ගොස් නොමැති සිගරට් වර්ග තිබේ නම්, ඒවා කවරේද;

(iii) 2012 මාර්තු මාසයේදී ඩන්හිල් වර්ගයේ දුම්වැටියක මිල ඉහළ ගිය ප්‍රමාණය කොපමණද;

(iv) එහි ප්‍රතිඵලයක් ලෙස එක් දුම්වැටියක් විකිණීමෙන් රජයට සහ දුම්කොළ සමාගමට ලැබුණු ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 සහ 2011 වර්ෂවලදී ශ්‍රී ලංකාවේ අලෙවිකළ මුළු සිගරට් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත අගයන්ට අනුව සිගරට් අලෙවියේ වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3268/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී වසමක් සඳහාම ''සේවා පියස'' කාර්යාලය බැගින් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) ඒ සඳහා වෙන් කොට ඇති මුදල කොපමණද;

(iii) ''සේවා පියස'' එක් කාර්යාලයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(iv) ''සේවා පියස'' පළමු කාර්යාලය ඉදිකරනු ලබන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3379/'12

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) උතුරු මැද පළාත් සභාව මගින් පාලනය කරනු ලබන රෝහල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් රෝහල සඳහා අනුමත වෛද්‍යවරු, හෙදියන්, රෝහල් කම්කරුවන් හා අනෙකුත් අනුමත කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝහල් අතරින් අනුමත කාර්ය මණ්ඩලයේ ඇති පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් රෝහල අනුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උතුරු මැද පළාත් සභාව මගින් 2012 වර්ෂය සඳහා එම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කරනු ලැබූ මුදල කොපමණද;

(ii) එම මුදලින් රෝහල්වල සිදුකළ සේවාවන් කවරේද;

(iii) 2012 වර්ෂයේදී උතුරු මැද පළාතේ එක් එක් රෝහල වෙතින් ප්‍රතිකාර ලබා ගෙන ඇති රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) සමස්තයක් වශයෙන් එම වර්ෂය තුළ ප්‍රතිකාර ලබාගත් එක් රෝගියෙක් සඳහා උතුරු මැද පළාත් සභාවෙන් වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3654/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති ජාතික පාසල්, නවෝදයා පාසල් හා ප්‍රාථමික පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසල්වල සිටින ශිෂ්‍ය සංඛ්‍යාව හා එක් එක් විෂයය අනුව ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත පාසල්වල ගුරු හිඟයක් තිබේද;

(iv) එසේ නම්, ගුරු හිඟයක් ඇති පාසල්වල නම් සහ ගුරු හිඟය පවතින විෂයයන් කවරේද;

(v) එම ප්‍රදේශයේ ගුරු හිඟයක් පවතී නම්, එය විසඳීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අම්පාර දිස්ත්‍රික්කයේ ඉහත (අ) (i) හි සඳහන් පාසල් අතරින් පුස්තකාල පහසුකම්, ජල පහසුකම් හා සනීපාරක්ෂක (වැසිකිලි) පහසුකම් නොමැති පාසල් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3943/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2005 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල සීමාව තුළ පත්කොට ඇති ජනාධිපති කොමිෂන් සභා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොමිෂන් සභා කවරේද;

(iii) එම එක් එක් කොමිෂන් සභාව සඳහා වැය කර ඇති මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත එක් එක් කොමිෂන් සභාව,

(i) සැදුම්ලත් සාමාජිකයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ සුදුසුකම් කවරේද;

(ii) පත් කිරීමේ අරමුණු කවරේද;

(iii) තම වාර්තා ඉදිරිපත් කර තිබේද;

(iv) එම වාර්තා සභාගත කරන්නේද;

(v) එම වාර්තා මගින් ලබා දී ඇති නිර්දේශයන් ක්‍රියාත්මකකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4408/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ හා ස්වේච්ඡා සංවිධාන මගින් පාලනය වන ළමා නිවාසවල වාසය කරන දරුවන් එම ළමා නිවාසවලින් පිටමං කර සමාජගත කිරීම සිදුකරනු ලබන වයස් සීමාව කවරේද;

(ii) එම වයස් සීමාවට එළැඹෙන තෙක් ළමා නිවාස තුළ දරුවන් සඳහා අධ්‍යාපනය ලබා දීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) ළමා නිවාසවලින් පිටමං කරන දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) ඔවුන් ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් මත කිසියම් රැකියා අවස්ථාවක් ලබා දීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4411/'13

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් අත්පත් කරගන්නා ලද ලංකා එනර්ජී පුද්ගලික සමාගමට අයත් කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති අතරින් මේ වන විට ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘති කවරේද;

(iv) එම එක් එක් ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිමකිරීමට ගතවන කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මෙතෙක් වැඩ කටයුතු ආරම්භ කර නොමැති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරියේදී ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4437/'13

ගරු තලතා අතුකෝරල මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉරිදා දිනයන්හි හා පොහොය දිනයන්හි උපකාරක පන්ති පැවැත්වීම තහනම් කර තිබේද;

(ii) එසේ නම්, එම තහනම බලපවත්නා ප්‍රදේශ කවරේද;

(iii) එම තහනම බලපවත්නා උපකාරක පන්ති අදාළ වන සිසුන්ගේ වයස් සීමාවන් කවරේද;

(iv) මේ පිළිබඳව මධ්‍යම රජය අනුගමනය කරනු ලබන පිළිවෙත කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2565/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සංචාරක පුරවරයක් වන අලුත්ගම නගරයේ පුළුල් මාර්ග පද්ධතියට සරිලන පරිදි ක්‍රමවත්ව සකසා නොමැති කාණු පද්ධතියේ අපද්‍රව්‍ය රැඳී අවහිරවීම නගරය පුරා දුර්ගන්ධයක් පැතිරයාමට හේතුවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගනු ලබන්නේ කවදාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) අලුත්ගම නගරයේ ඉදිකළ නව බස් නැවතුම්පළෙහි කඩ සාප්පු මේ වනතෙක් වෙළෙඳුන්ට ලබා නොදීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3156/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ කාර්යභාරය කවරේද;

(ii) කොළඹ කොටස් හුවමාරුවේ කාර්යභාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ හිටපු සභාපතිවරුන් වන ඉන්ද්‍රානි සුගතදාස මහත්මිය සහ තිලක් කරුණාරත්න මහතා විසින් හෙළි කරන ලද, 2011 සහ 2012 වර්ෂවලදී කොටස් වෙළෙඳපොළ මෙහෙයුම්වලට අදාළව සිදු වූ බවට වාර්තා වූ "මාෆියා" ක්‍රියාකාරකම් පිළිබඳව විමර්ශන සිදු කර තිබේද;

(ii) එම විමර්ශනවල වර්තමාන තත්ත්වය කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාමාර්ග නොගැනීමට හේතු කවරේද;

(iv) ක්‍රියාමාර්ග ගෙන සමථයකට පත් කරන ලද සිද්ධීන් සංඛ්‍යාව කොපමණද;

(v) එම බේරුම් කිරීම්වල පිරිවැය කවරේද;

(vi) එම බේරුම් කිරීම් දේශපාලන බලපෑම් මත සිදු වූ ඒවාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3293/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන්ට සිදුවන හිරිහැර පිළිබඳව සොයා බැලීම සඳහා 2008 ජුනි මාසයේදී යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ කාමර අංක 2/08 හිදී ඇමති අනුකමිටුවක් පිහිටුවනු ලැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට එම අනුකමිටුව අහෝසි කර තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ඇමති අනුකමිටුවේ කටයුතු පවත්වාගෙන ගිය ගොඩනැගිල්ලේ කුලිය, දුරකථන බිල්පත් සහ විදුලි බිල්පත් සඳහා වැය කරන ලද මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් වියදම්වලට අමතරව දරන ලද වෙනත් වියදම් සඳහා වැය වූ මුළු මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම වියදම් සිදුකරන ලද අමාත්‍යාංශ සහ ඊට අදාළ වැය ශීර්ෂයන් කවරේද;

(ii) ඉහත සඳහන් ගෙවීම් මෙතෙක් සිදුකර නොමැති නම්, එම ගෙවීම් සිදුකරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

3383/'12

ගරු පී. හැරිසන් මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ශ්‍රී ලංකාව තුළ ඇති කිරීමට අපේක්ෂිත ස්වභාවික වන අලි සංරක්ෂණ මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් එක් එක් මධ්‍යස්ථානයේ,

(i) නම, පිහිටීම, විශාලත්වය සහ ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) අපේක්ෂිත කාර්ය භාරය කවරේද;

(iii) ඉදිකරනු ලබන විදුලි වැටවල්වල දුර ප්‍රමාණය හා ඒවා ඉදිකිරීම සඳහා වෙන් කිරීමට අපේක්ෂිත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) විදුලි වැටවල් නඩත්තුව සඳහා යෙදවීමට අපේක්ෂිත නිලධාරීන් සංඛ්‍යාව සහ ඒ සඳහා වැයවන මුදල කොපමණද;

(v) එක් මධ්‍යස්ථානයක සේවයේ යොදවනු ලබන මුළු නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) හොරොව්පතාන වන අලි සංරක්ෂණ මධ්‍යස්ථානය තුළ,

(i) ඉදිකිරීමට නියමිත වැව් සංඛ්‍යාව හා ඒවා සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) ඉදිකරන තණ පිට්ටනි සංඛ්‍යාව සහ ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) අලි පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂිත කාලය කොපමණද;

(iv) පුනරුත්ථාපනය කරනු ලබන එම අලි මුදාහරින ප්‍රදේශ කවරේද;

(v) පුනරුත්ථාපනය කර මුදාහරින ලද අලි සම්බන්ධයෙන් පසු විපරමක් කරනු ලබන්නේ නම්, එය සිදු කරන ආකාරය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3908/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා-ඇල නගරයට යාබද දඬුගම ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සත්ව ගාල් සංඛ්‍යාව සහ සත්ව ඝාතකාගාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රදේශයේ නිරන්තරව එකතු වන ජීව අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ කවරේද;

(iii) එම අපද්‍රව්‍යවලට අදාළව යම් පාරිසරික හා සෞඛ්‍ය සංරක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මකවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?